# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ
# மாவட்ட செயலகம் – கொழும்பு
# DISTRICT SECRETARIAT – COLOMBO

ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 எல்விடிகல மாவத்தை, நாரஹேன்பிட்ட, கொழும்பு 05 ElvitigalaMw, Narahenpita, Colombo 05
විද්‍යුත් තැපෑල மின்னஞ்சல் E-mail: ds@colombo.dist.gov.lk වෙබ් අඩවිය இணைய தளம் Web site: colombo.dist.gov.lk


මගේ අංකය / எனது இல / My No: DIST.CMB/ES/09/T-05/2025
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.03.05

.........................................
.........................................
.........................................

**<u>කළමනාකරණ සේවා නිලධාරිසේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීමේ පාඨමාලාව -IX කණ්ඩායම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයට සංශෝධන ලෙස නිකුත් කර ඇති අංක 2052/26 හා 2018.01.04 දරණ අති විශේෂ ගැසට්පත්‍රයේ අංක 06 කරුණ කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කරමි.

02. ඒ අනුව කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I පන්තියේ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10ක පාඨමාලාව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් **2025 මාර්තු මස 17, 18, 19, 20, 21, 24, 25, 26, 27, 28** යන දිනවල **පෙ.ව. 8.30 සිට ප.ව.4.00** දක්වා මෙම කාර්යාලයේ **1** වන මහල ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. (නිල මැදුර, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05)

03.ඔබ ආයතනය මඟින් යොමු කර ඇති නාමලේඛනය අනුව **IX** කණ්ඩායමට ඇතුලත් වී ඇති නිලධාරීන්ගේ නාමලේඛනය මේ සමඟ ඉදිරිපත් කරන අතර, පුහුණු පාඨමාලාවට අදාල කාල සටහන ඉදිරියේදී යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

04. මෙම පාඨමාලාව සඳහා සහභාගී වන නිලධාරීන්ගේ පැමිණීම **2025.03.11** දිනට ප්‍රථම තහවුරු කළ යුතු අතර ඔවුන්ගේ **නම, ජා.හැ.අංකය සහ දුරකථන** අංකය(WhatsApp) අදාල ලිපියේ සඳහන් කිරීම අනිවාර්යයවේ. එම තොරතුරු **011-2369135** යන අංකයට ෆැක්ස් මඟින් හෝ <u>es9training.ds@gmail.com</u>යන විද්‍යුත් තැපෑලට යොමු කළ යුතුය.

05. පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ වැඩිදුර අවධානය යොමු කරන අතර ඒ පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කරන මෙන්ද කාරුණිකව දන්වා සිටිමි.

i. පුද්ගලික හෝ වෙනත් හේතුන් මත පාඨමාලාව සඳහා සහභාගී නොවන නිලධාරීන්ට මෙම වර්ෂය තුළ නවත් අවස්ථාවක් ලබා නොදෙනු ඇත.

ii. කැඳවනු ලබන දිනට සහභාගී නොවන නිලධාරීන් ඉදිරි වර්ෂයේදී පවත්වනු ලබන වැඩසටහනකට සහභාගි වන්නේ නම් ඒ සඳහා වියදම් වන මුදල අදාල නිලධාරියා විසින් දැරිය යුතු වේ.

iii. පාඨමාලාව සාර්ථකව නිම කිරීම වෙනුවෙන් ලබාදෙන සහතිකපත්‍රය ලබාගැනීම සඳහා **100%ක** සහභාගීත්වයක් නිලධාරියා විසින් ලබාගැනීම අනිවාර්යය වේ.



Scanned with ACE Scanner

iv. සියලුම නිලධාරීන් සුදුසු කාර්යාලීය ඇඳුමකින් සැරසීපැමිණිය යුතු අතර නිලධාරීන් විසින් ජාතික හැඳුනුම්පත හෝ කාර්යාලීය හැඳුනුම්පත රැගෙන ආයුතුය.

v. **පවත්නා ප්‍රතිපාදන ප්‍රමාණය සීමිත බැවින් මෙම පුහුණු වැඩසටහන සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය හා දිවා ආහාර සහභාගි වන්නන් විසින් සපයා ගත යුතු වේ.**

vi. තවද මෙම වැඩසටහන සඳහා සහභාගීවීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

06. කැඳවනු ලබන සියලුම නිලධාරීන් සහභාගි කරවීම ඔබ සතු වගකීමක් බව කාරුණිකව දන්වා සිටින අතර නාම ලේඛනයේ නම සඳහන් නමුත් මේ වන විට ඔබ ආයතනයෙන් ස්ථානමාරු වී ගොස් සිටින නිලධාරීන් ද මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

එම්.ඒ.එස්.කාංචනා ගුණවර්ධන
අතිරේක දිස්ත්‍රික් ලේකම්
දුරකථන -011- 2369136
ෆැක්ස් -011- 2369135
විද්‍යුත් ලිපිනය -discmbadm@gmail.com

අත්/කලේ:- ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර
දිස්ත්‍රික් ලේකම් /දිසාපති
කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය

Scanned with ACE Scanner